සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 06 - 2023

## ඉතිහාසය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

### I - පත්‍රය

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.
- අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

01) පොළොන්නරුවේ පිහිටි ................................................ පළමුවන පරාක්‍රමබාහු රජ දවස ඉදිකරවන ලදී.

( ශිව දේවාලය / ගල් විහාරය / කණ්ඨක චෛත්‍ය)

02) අදින් වසර 5000 කට පමණ පෙර ................................ වගාව මධ්‍යම මෙක්සිකෝව ප්‍රදේශයෙන් ආරම්භ විය.

( බඩ ඉරිඟු / වී / තිරිඟු )

03) හැකි මිනිසා යනුවෙන් හඳුන්වනු ලබන්නේ ............................................. මානවයා ය.

( හෝමෝ ඉරෙක්ටස් / හෝමෝ හැබිලස් / හෝමෝ සාපියන් )

04) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය ................................ නිම්නයේ පිහිටා ඇති පැරණි ශිෂ්ටාචාරයකි.

( නයිල් ගංගා / සින්දු ගංගා / ක්‍රිෂ්ණා නදී )

05) වලගම්බා රජුගේ අග බිසව ................................ දේවිය යි.

( ලීලාවතී / අනුලා / සෝමා )

- අංක 06 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

06) ලෝකයේ ප්‍රථමවරට ඇති වූ ජීවයක් සහිත දේ, ඉතාමත් කුඩා බැක්ටීරියාවකි. ( )

07) චීන ශිෂ්ටාචාරයට අයත් ජනතාව විසින් ප්‍රථමවරට මුද්‍රණය යන්ත්‍රය ලොවට හඳුන්වා දෙන ලදී. ( )

08) බුදුන්වහන්සේගේ දකුණු අකුධාතුව තැම්පත් කර රුවන්වැලි සෑය ඉදිකර ඇත. ( )

09) රජරට ප්‍රදේශයේ වැසියන් මහසෙන් රජු මින්නේරි දෙවියන් ලෙසද හඳුන්වයි. ( )

10) ධාතුසේන රජතුමා විසින් ථූපාරාම දැගැබට වටදාගෙයක් ඉදිකරවන ලදී. ( )

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු වලින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11) මෙරට ඉතිහාසය හැදෑරීමේදී වැදගත්වන පැරණිතම සාහිත්‍ය මූලාශ්‍රය වන්නේ,

1. දීප වංශය යි. 2. මහා වංශය යි. 3. ථූප වංශය යි. 4. බෝධි වංශය යි.

12) ඊජිප්තු ශිෂ්ටාචාරයේ පාලන කටයුතු මෙහෙයවන ලද රජ පෙළපත කුමක්ද?

1. හරප්පා 2. හමුරාබි 3. පාරාවෝ 4. ගිල්ගමේෂ්

13) තමන්ගේ ආගමික උත්සව පැවැත්වීමේ දී කාලය මැන ගැනීමට හිජ්රි වර්ෂ ක්‍රමය භාවිත කරන ලද්දේ,

1. හින්දු ආගමිකයන් විසිනි. 2. මුස්ලිම්වරු විසිනි.
3. කිතුණුවන් විසිනි. 4. බෞද්ධයන් විසිනි.

14) ලෝක ඉතිහාසයේ ගඩොලින් නිර්මාණය කරන ලද විශාලතම ස්තූපය වන්නේ,

1. ථූපාරාමය යි. 2. රුවන්වැලි මහා සෑය යි.
3. ජේතවනාරාමය යි. 4. අභයගිරිය යි.

15) පහත පාලකයන් අතරින් පණ්ඩුකාභය රජුගෙන් පසුව අනුරාධපුර රජ බවට පත් වූයේ කවුරුන්ද?

1. දේවානම්පියතිස්ස රජු 2. මුටසීව රජු
3. වසභ රජු 4. මහසෙන් රජු

- **ප්‍රශ්න 16 සිට 20 දක්වා ප්‍රශ්නවල හිස්තැනට අදාළ පිළිතුර ලියන්න.**

16) කුවේණිය යනු ලංකාවේ ජීවත් වූ ............................... ගෝත්‍රික කාන්තාවකි.

17) දුටුගැමුණු රජතුමා විසින් ඉදිකරවන ලද රුවන්වැලිසෑය ............................... නමින්ද හඳුන්වනු ලැබේ.

18) මළ සිරුරු කල්තබා ගැනීම සඳහා මමිකරණ ක්‍රමය ලෝකයට හඳුන්වා දෙන ලද්දේ ......................................... ශිෂ්ටාචාරයේ වැසියන් විසිනි.

19) පොළව යටින් ජලය ගෙන යාම හෙවත් ............................... ක්‍රමය වසභ රජුගේ ඉංජිනේරුවන් විසින් හඳුන්වා දෙන ලදී.


20) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ උස් කඳුකර ප්‍රදේශවල පිහිටි තැනිතලා බිම් ............................... ලෙස හැඳින්වේ.

(ලකුණු - 40)

II - කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01) දී ඇති ලෝක සිතියම උදව් කරගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(අ)

i. ලෝකයට වෙඩිබෙහෙත් හඳුන්වාදුන් ශිෂ්ටාචාරය A අක්ෂරයෙන් දැක්වේ. එම රට නම් කරන්න. (ල.01)


ii. ධර්මාශෝක රජු පාලනය කළ රට දැක්වෙන අක්ෂරය කුමක්ද? (ල.01)

iii. D හා G අක්ෂර වලින් හෝමෝසාපියන් මානවයන් ව්‍යාප්ත වූ මහාද්වීප දෙකක් දැක්වේ. එම මහාද්වීප දෙක නම් කරන්න. (ල.02)

(ආ)

i. A පින්තූරයේ දැක්වෙන නිර්මාණය කුමක් ද?

ii. මෙම නිර්මාණය කුමන ශිෂ්ටාචාරයකට අයත් වූවක් ද? (ල.04)



A

(ඇ)


i. B ඡායාරූපයේ දැක්වෙන ස්තූපය හඳුනාගෙන නම් කරන්න.

ii. එම ස්තූපය ඉදිකරන ලද පාලකයා කවුද?

iii. එම ස්තූපය පිහිටා ඇති රාජධානිය කුමක් ද?

iv. මෙම ස්තූපය ඉදිකර පූජා කරන ලද්දේ කුමන ස්වාමීන්වහන්සේට ද?

(ල.04)



B

(ඇ)



C

i. C අක්ෂරයෙන් නිරූපණය වන පින්තූරය හඳුනාගෙන නම් කරන්න. (ල.01)

ii. මේවා ඉදිකර ඇත්තේ කුමන යුගයක ජීවත් වූ මානවයන් විසින්ද? (ල.01)

iii. මෙම නිර්මාණය ඉදිකිරීම සඳහා භාවිත කර ඇති අමුද්‍රව්‍ය දෙකක් නම් කරන්න. (ල.02)

(මුළු ලකුණු - 16)

02) ඔබ ඉතිහාසය හැදෑරීමේදී උගත් තොරතුරු ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

i.

| මූලාශ්‍රය | රචනා වූ කාලය | කර්තෘ |
|---|---|---|
| .............................. | ක්‍රි.ව. හතරවන සියවස | හඳුනාගෙන නැත. |
| මහාවංශය | .......................................... | .............................. |

(ල.03)

ii. නව ශිලා යුගයේ ජීවත් වූ මිනිසා විසින් වගා කරන ලද ධාන්‍ය බෝග වර්ග හතරක් නම් කරන්න. (ල.04)

iii. පුරා ශිලා යුගයේ මිනිසාගේ ජීවන රටාවේ කැපීපෙනෙන ලක්ෂණ හතරක් නම් කරන්න. (ල.04)

03)

i. මෙසොපොතේමියානු වැසියන් දෙවියන් සේ සළකා පූජාවට ලක්කරන ලද ස්වභාවික වස්තු හෝ සිදුවීම් තුනක් නම් කරන්න. (ල.03)

ii. පහත නිර්මාණ අයත් ශිෂ්ටාචාර දක්වමින් වගුව සම්පූර්ණ කරන්න.

| ස්මාරකය | ශිෂ්ටාචාරය |
|---|---|
| කූන්‍ය අක්ෂරය | .................................................. |
| නෙෆරටිටි රැජින | .................................................. |
| සත්ව සංකේත සහිත මැටි මුද්‍රා | .................................................. |
| ටුටන් කාමන් රජුගේ රතින් කළ වෙස්මූණ | .................................................. |

(ල.04)

iii. පැරණි මෙසොපොතේමියානු සමාජය බෙදී තිබූ කොටස් හතර නම් කරන්න.

(ල.04)

04)

i. ශ්‍රී ලංකාවේ, මුලින්ම වාසය කරන ලද මානවයා ආහාරයට ගත්,

A. ශාකමය ආහාර දෙකක් නම් කරන්න.

B. සත්ත්වමය ආහාර වර්ගයක් නම් කරන්න. (ල.03)

ii. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. විජය කුමරු මෙරටට පැමිණෙන විට යක්ෂ ගෝත්‍රික කණ්ඩායම් විසූ නගර දෙකක් නම් කරන්න.

2. විජය කුමරුගේ දරුවන් දෙදෙනාගේ නම් ලියන්න. (ල.04)

iii. පණ්ඩුකාභය රජතුමා විසින් ගොඩනගන ලද අනුරාධපුර නගරයේ දැකිය හැකි නාගරික ලක්ෂණ හතරක් ලියන්න. (ල.04)

05)

i. මිහිඳු හිමියන් සමඟ මෙරටට වැඩම කළ රහතන් වහන්සේලා තිදෙනෙක් නම් කරන්න. (ල.03)

ii. පහත සඳහන් ඇළ මාර්ග හා වැව් ඉදිකරන රජවරු කවුරුන්දැයි වරහන්තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

(ධාතුසේන රජු, වසභ රජු, මහසෙන් රජු, දේවානම්පියතිස්ස රජු)

| වැව් හා ඇළ මාර්ග | ඉදිකරන ලද පාලකයා |
|---|---|
| හුරුළු වැව | ........................................ |
| ඇළහැර ඇල | ........................................ |
| තිසා වැව | ........................................ |
| යෝධ ඇළ | ........................................ |

(ල.04)

iii. එළාර රජු පැරදවීමේදී දුටුගැමුණු රජුට සහාය වූ සේනාපතිවරු හතර දෙනෙක් නම් කරන්න. (ල.04)

06)

i. මහසෙන් රාජ්‍ය සමයේ ඉදි වූ වෙහෙර විහාර තුනක් නම් කරන්න. (ල.03)

ii. පහත සිදුවීම්වලට අදාළ පාලකයන් නම් කරන්න.

A. වල්ලිපුරම් රන්පත ලියවීම හා ඉසිගිරි ඇමතිවරයා යාපනය ප්‍රදේශය පාලනය කිරීමට පත් කිරීම.

B. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරවීම.

C. එළාර රජු මියගිය පසු ආදාහනය කළ සොහොනට ගෞරව කළයුතු බවට අණ කිරීම.

D. ශ්‍රී මහා බෝධින් වහන්සේ මෙරටට වැඩම කරවීම හා රෝපණය කිරීම. (ල.04)


iii. දුටුගැමුණු රජුගෙන් ඉටු වූ සේවාවන් දෙකක් ලියන්න. (ල.04

07)

i. දඩයම් යුගයේ මානවයා අනුගමනය කළ අවමංගල චාරිත්‍ර විධි තුනක් සඳහන් කරන්න. (ල.03)

SSS

ii. පහත සංකල්ප සිතියමේ අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ප්‍රශ්නයට අදාළ ඉංග්‍රීසි අක්ෂරය යොදා ලියන්න.




(ල 04)

iii. පහත **ii** තීරුවේ ඇති තොරතුරු හා **iii** තීරුවේ සඳහන් තොරතුරු ගැලපෙන සේ නිවැරදිව යා කරන්න.

| **ii** | **iii** |
|---|---|
| 1. සද්ධාතිස්ස | A. ලංකාවේ ප්‍රථම භික්ෂුණිය |
| 2. අනුලා දේවිය | B. ජේතවනාරාමය |
| 3. පටී ධාතුව | C. බැමිණිතියා සාගතය |
| 4. වලගම්බා රජතුමා | D. දුටුගැමුණු රජුගේ සහෝදරයා |

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 06 - 2023

## ඉතිහාසය – පිළිතුරු පත්‍රය

නම / විභාග අංකය:

### I - කොටස

| | | | |
|---|---|---|---|
| 1 - ගල් විහාරය | 6 - (✓) | 11 - 1 | 16 - යක්ෂ |
| 2 - බඩ ඉරිඟු | 7 - (✓) | 12 - 3 | 17 - මහාථූප |
| 3 - හෝමෝ හැබිලස් | 8 - (x) | 13 - 2 | 18 - ඊජිප්තු |
| 4 - සින්දු ගංගා | 9 - (✓) | 14 - 3 | 19 - උමං ජල මාතිකා |
| 5 - සෝමා | 10 - (x) | 15 - 2 | 20 - සානුව |

(ල 2 x 20 = 40)

### II - කොටස

01)

(අ) i. චීනය
ii. B
iii. D - උතුරු ඇමරිකා
G - ඕස්ට්‍රේලියාව (ල.4)

(ආ) i. මැටි කරත්තයක අනුරුවක් / මැටි කරත්තයක්
ii. ඉන්දු නිම්න ශිෂ්ටාචාරය (ල.2 x 2 =4)

(ඇ) i. අභයගිරිය
ii. වලගම්බා රජු
iii. අනුරාධපුරය
iv. කුපික්කලතිස්ස ස්වාමින් වහන්සේට (ල.4)

(ඈ) i. තාවකාලික පැල්පතක්
ii. මධ්‍යශිලා යුගයේ
iii. ලී දඬු, කොළ අතු, (ල.4) (මුළු ලකුණු : 16)

02)

(I) i. දීප වංශය
ii. ක්‍රි.ව. පස්වන සියවස
iii. මහානාම හිමි (ල.3)

(II) තිරිඟු, බාර්ලි, වී, කුරක්කන්

(III) කණ්ඩායම් ලෙස ජීවත් වීම, මළගිය ඥාතින් වෙනුවෙන් අවමංගල චාරිත්‍ර පැවැත්වීම, දඩයම් කිරීම, තැන - තැන ඇවිද ආහාර රැස් කිරීම, චිත්‍ර ඇඳීම, ගල් වලින් රූප සකස් කිරීම.

(8) WWW.PastPapers.WiKi (7)



Download Term Test Papers, Short Notes From One Place!

03)

i. වර්ෂාව, සුළඟ, ගංවතුර
ii. A මෙසොපොතේමියානු
B ඊජිප්තු
C ඉන්දු නිම්න
D ඊජිප්තු
iii. පූජකයින්
ඉහළ පන්ති වලට අයත් වැසියන්
පහළ පන්ති වලට අයත් වැසියන්
වහලුන්

04)

i. A වල්දෙල්, වල් කෙසෙල්, කටු අල.
B මුවන්, හාවන්, දඬුලේනුන්, ඉත්තෑවන්, ඉබ්බන්, ගොළුබෙල්ලන් ආදී.
ii. 1. සිරස වස්තුව හා ලංකාපුරය
2. ජීව හත්ථ, දිසාල
iii. ප්‍රදේශය වටා දිය අගලක්
ප්‍රධාන දිශා හතරට දොරටු හතරක්
මාර්ග පද්ධති
නගරය ඇතුළත උද්‍යාන, පොකුණු

05)

i. ඉට්ඨිය, උත්තිය, සම්බල, බද්ධශාල
ii. 1. මහසෙන් රජු
2. වසභ රජු
3. දේවානම්පියතිස්ස රජු
4. යෝධ ඇළ
iii. නන්දිමිත්‍ර ගෝඨයිඹර වේළුසුමන පුස්සදේව
සුරනිමල ථේරපුත්තාභය ලභිය වසභ මහාසෝණ
භරණ ඛංජදේව

06)

i. මින්නේරි විහාරය, ගෝකණ්ණ විහාරය, එකාපිල්ල විහාරය, දාසෙන්ගල විහාරය
ii. A. වසභ රජු
B. වලගම්බා රජු
C. දුටුගැමුණු රජු
D. දේවානම්පිමතිස්ස රජු
iii. රට එක්සේසත් කිරීම, රුවන්වැලිසෑය ආදී වෙහෙර විහාර ඉදි කිරීම.

07)

i. ගල් ගුහා තුළ වැලලීම
වකුටු කොට වළා තිබීම
ඇට සැකිලි තුල රතු ගුරු ගල් අලේප කිරීම.
ii. A වල්ලිපුරම් රන්පත
B ඉසුරුමුණි විහාරය
C මහ විලච්චිය, මනාකැටිය, නොච්චිපතාන
D ලම්බකර්ණ
iii. 1. D
2. A
3. B
4. C

PAST PAPERS WIKI
(8) WWW.PastPapers.WiKi (8)

Download Term Test Papers, Short Notes From One Place!

# LOL.lk BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න






| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**